# යාපහුව ලෙන් විහාරයේ බිතුසිතුවම්වල හායනකාරක පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එච්.එම්.එස්.ඩී. චන්ද්‍රසේකර[1]

ප්‍රමුඛ පද: යාපහුව, බිතුසිතුවම්, හායනකාරක, ලෙන් විහාරය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ හතරවෙනි රාජධානිය ලෙසින් විරුදාවලියට පත් යාපහුව රාජධානියේ ස්වභාවික ගල්ලෙනක් තුළ ඇඳ ඇති බිතු සිතුවම් රාශියක් වර්තමානය තුළද හඳුනාගත හැකිය. මෙම සිතුවම් මහනුවර යුගයට එනම් 18 වන සියවසට පමණ අයත්වේ. රාජාධිරාජසිංහ රජු විසින් මෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර ඇති අතර වර්තමානය තුළදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරනු ලබයි. මෙම සිතුවම් වර්තමානය වන විට විවිධ වූ කාරණා හේතුවෙන් හායනයට ලක් වෙමින් ඇති ආකාරය දැකගත හැකිය. එසේ හායනය වීම සඳහා බලපාන සාධක මොනවාද යන්න අධ්‍යයනය මෙහි මූලික අරමුණයි. ඒ හායනකාරක මගින් බිතු සිතුවම් හායනය සඳහා කොපමණ දුරකට බලපෑම ඇති කරන්නේද යන්න පිළිබඳවද අධ්‍යයනය කළ හැකිය. තවද මෙම උරුම ක්ෂේත්‍රයේ ප්‍රාදේශීය, ජාතික වශයෙන් වැදගත් වුවද ප්‍රාදේශීය ජනතාවට එහි අගයක් නොමැතිකම සහ එහි වැදගත්කම පිළිබඳ නොදැනුවත්කම මේ ආශ්‍රිතව ඇති ප්‍රධාන ගැටලුවක් ලෙස හඳුනාගත හැකිය.

## ක්‍රමවේදය

මෙම අධ්‍යනය සඳහා ගුණාත්මක පර්යේෂණ මගින් තොරතුරු සපයා ගන්නා ලදී. මූලික වශයෙන් ක්ෂේත්‍ර ගවේෂණය තුළින් ලබා ගත් තොරතුරු ද, එම ස්ථානයෙන් ලබාගත් ඡායාරූප, විවිධ සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් ලබාගන්නා තොරතුරු මෙම අධ්‍යනයට පාදක කරගෙන ඇත.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

යාපහුව 13 වන සියවසේ අගනුවරක් ලෙසින් පැවති අතර එහි ලෙන්විහාරයේ සිතුවම් මහනුවර යුගය තුළ නිර්මාණය කර ඇති බවට තොරතුරු අනාවරණය වේ. 18 වන සියවසේ අගභාගයේදී මහනුවර රජු රාජාධිරාජසිංහ විසින් නැවත පිහිටුවන ලද ආරාමය යාපව්ව රජමහා විහාරය ලෙසින් නම් කර එහි වූ සිතුවම් ප්‍රතිසංස්කරණය කර තිබේ.

[1] පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
Sewminidilhani66@gmail.com

ඉන් පසුව විවිධ වූ අවධීන් යටතේ එය ප්‍රතිසංස්කරණය කරමින් වර්තමානය දක්වා පැවතෙන්නට ඇති බව පැහැදිලිය. එම සිතුවම් පාෂාණ මතුපිට නිර්මාණය කර ඇති ආකාරය එහි යන්නෙකුට දැකබලාගත හැකිය. පාෂාණය මත මැටි, වැලි සහ කාබනික තන්තු වැනි දේශීය ද්‍රව්‍ය වලින් සාදන ලද ස්ථරයක් තුල නිමවා ඇත. කාබනික ප්‍රභවයන්ගෙන් ලබාගත් වර්ණක භාවිතා කරමින් මෙම සිතුවම් වර්ණ ගන්වා ඇත.

වර්තමානය වන විට මෙහි සිතුවම් හායනයට ලක් වෙමින් පවතින අතර ඒ පිළිබඳ අධ්‍යයනය කිරීමේදී ඒ සඳහා තුඩු දෙන විවිධ වූ හායනකාරකයන් පිළිබඳ හඳුනාගැනීමට හැකි විය.

පාරිසරික සාධක ගත්කළ ඉහළ සාපේක්ෂ ආර්ද්‍රතාවය ශ්‍රී ලංකාවේ ලෙන් විහාරවල බහුලව දක්නට ලැබෙන ගැටලුවකි. ඒ අනුව ගුහාව තුලට විශාල වශයෙන් ජලවාෂ්ප ප්‍රමාණයක් එකතුවීම නිසාවෙන් මෙම තත්ත්වය ඇති විය හැකිය. යාපහුව ලෙන් විහාරය තුලද වර්ෂා ජලය ඉහළ සිට වැස්සීමක් දැකගත හැකි අතර මේ නිසාවෙන් ඒ තුළ ඇති සිතුවම් හායනයට ලක්වීමේ අවස්ථාවක් නිර්මාණය වී ඇති බව පැහැදිලිය. ඒ අනුව බදාම ස්ථරය ඉදිවීම, හැකිලීම ඒ තුළ සිදුවන ඉරිතැලීම තීන්ත ක්ෂය වීම දැකගත හැකිය. තවද මෙම ලෙන පැරණි නිසාවෙන් අධික වර්ෂා සහිත කාලවල දී විහාරය තුළට වර්ෂා ජලය වැස්සීම සිදුවනු දැකගත හැකිය. එම හේතුව නිසාවෙන් ගලා එන ජලයට සිතුවම් සේදී විනාශවී ඇති ආකාරයෙන් දැකගැනීමේ හැකියාවක් ඇත. තවද මෙම විහාරය ගලින් නිර්මාණය කර තිබීම නිසා අධික උෂ්ණත්ව සහිතව කාලවලදී අධික ලෙසින් රත්වීම නිසා පළුදුවීම් වලට ලක්වී ඇති ආකාරය දැකගත හැකිවේ. එම නිසාවෙන් සිතුවම් මැදින් පැළුම් දාර දැකගැනීමේ අවස්ථාව උදා වේ.

ජීව විද්‍යාත්මක සාධක ගත් විට යාපහුව බිතුසිතුවම්වලට සැලකිය යුතු තර්ජන එල්ල කිරීමට සමත් වී ඇති බව පැහැදිලි වේ. ඇල්ගී, දිලීර සහ බැක්ටීරියා තීන්ත ස්ථර මත සහ ඇතුළත වර්ධනය වී ඇති අතර එමඟින් සිතුවම් දුර්වර්ණ වීම, හානිකර පැල්ලම් ඇති වීම දැකගත හැකිය. එමෙන්ම බිතු සිතුවම් තුළ ලයිකන සහ පාසි වර්ධනය වී ඇති ආකාරය දැකගත හැකිය. එමෙන්ම වර්ෂාවෙන් ගලායන ජලය නිසා ඇතිවන සීතලෙන් දිය සෙවෙල් නිර්මාණය වී තිබීම ද මේ තුළ හඳුනාගත හැකිය. එතුලින් සිතුවම් විනාශයට ලක් වී ඇති ආකාරය හඳුනාගත හැකි වේ. කෘමීන් සහ සත්ව ක්‍රියාකාරකම් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී කුඹලන් වැනි සතුන් සිතුවම් මතුපිට ඔවුන්ගේ නිවාස සාදාගෙන සිටීම, හූනන් වැනි සතුන්ගේ මළමූත්‍ර කිරීම්, මකුළුවන් සිතුවම් මත මකුළු දැල් නිර්මාණය කර තිබීම ආදිය මේ තුළ සුලභව දැකගත හැකි හායනකාරකයන් ලෙස හඳුන්වා දීමට පිළිවන. තවද වේයන් විසින් බඳින ලද තුඹසක්ද මෙම ලෙන් විහාරයේ සිතුවම් ආශ්‍රිතව දැක ගැනීමට අවස්ථාව ඇත. ඒ තුළින් සිතුවම් වැසී ගොස් දුර්වර්ණව පැවතීම දක්නට ලැබේ. මොවුන්ගෙන් අලුතින් නිර්මාණය කරන ලද වහලයටද තර්ජනයක් එල්ලවී ඇති බව පෙනේ.

මානව සාධක ගත් විට ලෙන්විහාරය තුළට ස්වාභාවික ආලෝකය නොලැබුනද වන්දනාකරන්නන්ගේ පහසුවට කෘතිම ආලෝකය සපයා ඇත. එසේ ආලෝකය ලබා ගැනීමේදී වයර් ආදිය සිතුවම් මතින් ගෙනගොස් නිර්මාණය කර තිබෙනු දක්නට ලැබේ. ඒ නිසා පැහැදිලිව සිතුවම් බලාගැනීමේ අවස්ථාව නරඹන්නන්ට අහිමිව ඇත. සිතුවම් මත සීරීම් සිදුකර තිබෙනු දැකගත හැකිවේ. නරඹන්නන් ස්පර්ශ කිරීමෙන් සිතුවම් වල ඇති වර්ණයන් ක්‍ෂය වී ඇත. එමෙන්ම විහාරගේ තුළ පන්සිල් කටයුතු සිදු කිරීමේ දී ඒ තුළට පැමිණෙන පුද්ගලයන් බිත්ති තුළට හේත්තුව හිස සිතුවම් මත තබා සිටීම නිසා තෙල් පැල්ලම් සිතුවම් තුළ තැවරීමෙන් ඒවා දුර්වර්ණව ගිය ස්වභාවයක් දක්නට ඇත. වරකට විශාල පුද්ගලයින් සංඛ්‍යාවක් ලෙන් විහාරය තුළට ඇතුළු වීමෙන් ඔවුන් ප්‍රශ්වාස කිරීමෙන් පිටවන කාබන්ඩයොක්සයිඩ් වායුව නිසාවෙන් මෙම සිතුවම්වලට අහිතකර තත්ත්ව ඇතිවීමේ අවස්ථාව පවතින බව අනාවරණය විය. තවද මෙම විහාරය ඇතුළත සුවඳ දුම් දැල්වීම, පහන් දැල්වීම ආදිය නිසාවෙන් ඇතිවන දුම කළුදැලි නිසාවෙන් සිතුවම් විනාශයට ලක්ව ඇති ආකාරය දැකගත හැකි නමුත් වර්තමානයේ දී එම තත්ත්වයෙහි යම්කිසි අඩුවක් පෙනීයයි.

**සමාලෝචනය**

පාරිසරික, ජීව විද්‍යාත්මක සහ මානව සාධක යන හායනකාරකයන් මෙම සිතුවම් වල ආයු කාලය කෙටි කිරීමට වග වී ඇති බව මේ තුළින් පැහැදිලි විය. විශේෂයෙන්ම මානවයාගේ නොමනා ක්‍රියාකාරකම් ප්‍රබල බලපෑමක් ඇති කර ඇති ආකාරය හඳුනාගත හැකිය. මෙම අධ්‍යනයේ දී පැහැදිලි වූ තවත් කරුණක් නම් ප්‍රමාණවත් අරමුදල් නොමැතිකම, පුහුණුව ලත් පිරිස් නොමැතිකම සහ පුළුල් කළමනාකරණ සැලසුම් නොමැතිකම, දුර්වල අධීක්ෂණය නිසාවෙන් මෙම සිතුවම් තවදුරටත් විනාශ වන බවයි.

**ආශ්‍රිත මූලාශ්‍රය**

හේරත් බණ්ඩාර මැදගම කේ.එම්, (2010). ***යාපහුවේ කලා ශිල්ප.*** කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

Menaka Nishanthi. (n.d.). *PLASTER AND COLOUR TECHNOLOGY OF ANCIENT SRI LANKAN MURALS*. ARF India. Available at: https://arfjournals.com/image/72493_10_meneka-new.pdf (Accessed 15 July 2025).

**සම්මුඛ සාකච්ඡා**

කරුණාරත්න, වසන්ත. (2025). යාපහුව ලෙන් විහාරය පිළිබඳව. එච්.එම්.එස්.ඩී. චන්ද්‍රසේකර, 2025/ 02/07